SRI LANKA

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර III විභාගය - 2025 ජූලි

යෝජිත උත්තර

(301) මූල්‍ය වාර්තාකරණය (FAR)

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

නො. 540 , පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,

නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අදියර III විභාගය 2025 ජනවාරි

(301) මූල්‍ය වාර්තාකරණය

යෝජිත උත්තර

අනිවාර්ය ප්‍රශ්න 4 කි (මුළු ලකුණු 20)	A කොටස

පළමුවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 01

(a) මූල්‍ය වාර්තාකරණය සඳහා වු සංකල්පනාත්මක ආකෘතිමය රාමුවට අනුව මූලික ගුණාත්මක ලක්ෂණ දෙක වන්නේ අදාළබව සහ විශ්වාසනීය නියෝජනයයි. ගනු ලබන තීරණ වලට වෙනසක් කිරීමට තොරතුරකට හැකියාව තිබේ නම් එය අදාළ බව වේ. අදාළත්වයේ උප ගුණාංග අතර පුරෝකථන වටිනාකම, තහවුරු කිරීමේ වටිනාකම සහ ප්‍රමාණාත්මක බව ඇතුළත් වේ.

විශ්වාසනීය නියෝජනයට අනුව මූල්‍ය වාර්තා මගින් ආර්ථික සංසිද්ධීන් වචන සහ සංඛ්‍යා වලින් නිරූපණය කළ යුතුය. විශ්වාසනීය නියෝජනය සඳහා, තොරතුරු සම්පූර්ණ, මධ්‍යස්ථ සහ දෝෂ වලින් තොර විය යුතුය.

(ලකුණු 03 යි)

(b)

- සංසන්දනාත්මක බව
- සත්‍යාපනය කළ හැකි බව
- කාලානුරූපී බව
- අවබෝධ කරගත හැකි බව
  (ඉහත සඳහන් දෙකක් පමණක් ප්‍රමාණවත් වේ)

(ලකුණු 02 යි)
(මුළු ලකුණු 05)

දෙවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 03

- ව්‍යාපාර ආකෘතිය
- ආයතනික දල විශ්ලේෂණය සහ බාහිර පරිසරය
- අවදානම් සහ අවස්ථා
- උපායමාර්ග සහ සම්පත් වෙන් කිරීම
- ඉදිරි දැක්ම
- පාලනය
- කාර්ය සාධනය

- පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ පදනම

(ඉහත සඳහන් කරුණු පහක් පමණක් ප්‍රමාණවත් වේ)

(මුළු ලකුණු 05)

තුන්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 05

කීර්තිනාමය ගණනය කිරීම	**රු.000**	
මුළු ආයෝජනය		
මව් සමාගමේ ප්‍රතිෂ්ඨාව	15,000	
පාලනය යටත් නොවන හිමිකමේ සාධාරණ අගය	4,500	19,500
(-)අත්පත් කරගන්නා දිනට පරිපාලිතයේ ශුද්ධ වත්කම් වල සාධාරණ අගය		
ප්‍රකාශිත ප්‍රාග්ධනය	10,000	
රඳවාගත් ඉපැයුම්	4,500	
ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තය	1,500	16,000
කීර්තිනාමය		3,500

(මුළු ලකුණු 05)

හතරවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 02

(a) දේපල පිරියත සහ උපකරණ හඳුනාගැනීමේ නිර්ණායක

- අයිතමය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ සම්භාවිතාවක් තිබේ නම්; සහ
- අයිතමයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි නම්.

(ලකුණු 02)

(b) තොග තක්සේරු කිරීමේ ක්‍රමය වෙනස් කිරීම

ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීමේ (FIFO) සිට බරිත සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමයට තොග අගය කිරීමේ ක්‍රමය වෙනස් කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනසක් වේ. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS for SMEs) අනුව, ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස ස්වේච්ඡා වෙනසක් බැවින්, එය අතීතයානුයෝගීව ගලපනු ලැබේ.

එමනිසා, සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පසුගිය වර්ෂයේ සංසන්දනාත්මක සංඛ්‍යා සහ කොටස් හිමියන්ගේ ස්කන්ධයේ වෙනස්වීම දැක්වෙන ප්‍රකාශනය නැවත පිළියෙල කළ යුතුය.

ශුද්ධ උපලබ්ධි අගය

තොගය තක්සේරු කරනු ලබන්නේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයකට ය. ලබා දී ඇති තොරතුරු අනුව ශුද්ධ උපලබ්ධි අගය පිරිවැයට වඩා වැඩි ය.

(ලකුණු 03)

(මුළු ලකුණු 05)

A කොටසෙහි අවසානය

අනිවාර්ය ප්‍රශ්න 3 කි. (මුළු ලකුණු 30)	**B කොටස**

පස්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 03

සීමා සහිත Chemiro පෞද්ගලික සමාගම
2025/03/31 න් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු.000'

මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
බදු පෙර ශුද්ධ ලාභය (පෙරවැඩ 02)	15,337	
+/- ගැලපුම්		
පොලී වියදම	8,100	
පාරිතෝෂිත සඳහා වෙන් කිරීම්	1,750	
යන්ත්‍ර ඉවත් කිරීමේ ලාභය (පෙරවැඩ 05)	(2,750)	
ක්ෂය (පෙරවැඩ 04)	35,890	
කාරක ප්‍රාග්ධන සංචලනයට පෙර මෙහෙයුම් ලාභය	58,327	
කාරක ප්‍රාග්ධන සංචලනයන්		
තොග අඩුවීම	51,019	
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ වැඩි වීම	(12,596)	
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩි වීම	4,980	
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	**101,730**	
(-)පාරිතෝෂිත ගෙවීම්	(6,970)	
(-)බදු ගෙවීම් (පෙරවැඩ 01)	(5,800)	
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		88,960
ආයෝජන කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
යන්ත්‍ර විකුණුම්	9,500	
නව යන්ත්‍ර මිලට ගැනීම (පෙරවැඩ 03)	(78,470)	
ආයෝජන කටයුතු වල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය		(68,970)
මූල්‍ය කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
ණය ලබා ගැනීම (පෙරවැඩ 07)	10,000	
ගෙවූ ණය පොලිය (පෙරවැඩ 06)	(1,710)	
ගෙවූ ණය	(20,500)	
ලාභාංශ ගෙවීම	(1,280)	
මූල්‍ය කටයුතු වල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය		(13,490)
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වෙනස් වීම		**6,500**
කාලච්ඡේදයේ ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ		8,900
කාලච්ඡේදයේ අවසන් මුදල් හා මුදල් සමාන දෑ		**15,400**

aat SRI LANKA

පෙරවැඩ

පෙරවැඩ 01– ආදායම් බදු වියදම

ආදායම් බදු

ආදායම් බදු වියදම	හර	3,400
ගෙවිය යුතු ආදායම් බදු	බැර	3,400

ගෙවිය යුතු ආදායම් බදු ගිණුම

මුදල්	5,800	ඉ/ගෙ/ශේෂය	5,640
ප/ගෙ/ශේෂය	3,240	බදු වියදම	3,400
	9,040		9,040

පෙරවැඩ 02

රඳවාගත් ඉපැයුම් ගිණුම

බදු වියදම	3,400	ඉ/ගෙ/ශේෂය	114,939
ලාභාංශ	1,280	බදු පෙර ලාභය	15,337
ප/ගෙ/ශේෂය	125,596		
	130,276		130,276

බදු හා පොලී පෙර ලාභය	23,437
(-) පොලී වියදම	(8,100)
බදු පෙර ලාභය	**15,337**

පෙරවැඩ 03

දේ.පි.උපකරණ ගිණුම

ඉ/ගෙ/ශේෂය	156,930	ඉවත් කිරීම	15,000
මුදල්	78,470	ප/ගෙ/ශේෂය	220,400
	235,400		235,400

පෙරවැඩ 04

සමුච්චිත ක්ෂය ගිණුම

ඉවත්කිරීමේ ගිණුම	8,250	ඉ/ගෙ/ශේෂය	101,460
ප/ගෙ/ශේෂය	129,100	ක්ෂය	35,890
	137,350		137,350

පෙරවැඩ 05

යන්ත්‍ර ඉවත්කිරීමේ ගිණුම

යන්ත්‍ර	15,000	සමුච්චිත ක්ෂය.	8,250
ලා/ලා	2,750	මුදල්	9,500
	17,750		17,750

දේ.පි.උපකරණ ඉවත්කිරීම

මුදල්	හර	1,500
ඉවත්කිරීමේ ගිණුම	බැර	1,500

aat SRI LANKA

ඉවත් කල යන්ත්‍ර පිරිවැය

යන්ත්‍ර ඉවත්කිරීමේ ගිණුම	හර	15,000
යන්ත්‍ර	බැර	15,000

ඉවත් කල යන්ත්‍රයේ සමුච්චිත ක්ෂය

ඉවත් කල යන්ත්‍රයේ ආරම්භක සමුච්චිත ක්ෂය	7,500
ක්ෂය 1/4/24 – 1/10/24 (15,000/10X6/12)	750
ඉවත් කල යන්ත්‍රයේ මුළු සමුච්චිත ක්ෂය	**8,250**

පෙරවැඩ 06– පොලී වියදම්

පොලී වියදම්	හර	8,100	
ගෙවිය යුතු පොලී	බැර		8,100

ගෙවිය යුතු පොලී ගිණුම

මුදල්	1,710	ඉ/ගෙ/ශේෂය	1,040
ප/ගෙ/ශේෂය	7,430	පොලී වියදම්	8,100
	9,140		9,140

පෙරවැඩ 07– ණය (ජංගම හා ජංගම නොවන කොටස්)

ණය ගැනීම

මුදල්	හර	10,000	
බැංකු ණය	බැර	10,000	

බැංකු ණය ගිණුම

මුදල්	20,500	ඉ/ගෙ/ශේෂය	42,900
ප/ගෙ/ශේෂය	32,400	මුදල්	10,000
	52,900		52,900

පෙරවැඩ 08

පාරිතෝශිත සඳහා වෙන් කිරීම් ගිණුම

මුදල්	6,970	ඉ/ගෙ/ශේෂය	26,700
ප/ගෙ/ශේෂය	21,480	පාරිතෝශිත වියදම්	1,750
	28,450		28,450

(මුළු ලකුණු 10)

SRI LANKA

හයවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 02

(a)

	2024/25	2025/26
හඳුනාගත යුතු අයභාරය	436,174	91,826
පෙරවැඩ	01 හා 02	

පෙරවැඩ 01

කාර්යය සාධන බැඳීම	තනි මිල ගණන්	ගණුදෙනුව සඳහා වෙන්කිරීම	අයභාරය හඳුනාගත යුතු අවස්ථාව
වායු සමීකරණ	360,000	344,348 (528,000 X 360,000/552,000)	ගණුදෙනුකරු ගිවිසුම අනුමත/පිලිගන්නා අවස්ථාවේ (01/04/2024)
නඩත්තුව	192,000 (8,000 X 24 මාස)	183,652 (528,000 X 192,000/552,000)	මාස 24ක සේවා කාලය තුළ
මුළු වටිනාකම	552,000	528,000	

පෙරවැඩ 02

	2024/25	2025/26
වායු සමීකරණ	344,348	-
වාර්ෂික නඩත්තු සේවාව (183,650/2)	91,826	91,826
මුළු වටිනාකම	436,174	91,826

(ලකුණු 04)

(b)

2025/03/31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ උපුටා ගැනීම්

	රු.
භාවිත අයිතිය සහිත වත්කම් ක්ෂය (W1)	(1,750,000)
කල්බදු පොලී (W2)	(840,000)

2025/03/31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උපුටා ගැනීම්

	රු.
ජංගම නොවන වත්කම්	
භාවිත අයිතිය සහිත වත්කම් **(W1)**	5,250,000
ජංගම නොවන වගකීම්	
කල්බදු වගකීම **(W2)**	3,390,850
ජංගම වගකීම්	
කල්බදු වගකීම **(W2)**	1,389,921

පෙරවැඩ 01 – භාවිත අයිතිය සහිත වත්කම්

	Rs.
මූලික ගෙවීම	1,000,000
මූලික කල්බදු වගකීම	6,000,000
පිරිවැය	7,000,000
(-)සමුච්චිත ක්ෂයවීම් (7,000,000/4)	(1,750,000)
ධාරණ අගය	5,250,000

පෙරවැඩ 02 – කල්බදු වගකීම

		Rs.
මූලික කල්බදු වගකීම		6,000,000
කල්බදු පොලිය (6,000,000 X 14%)		840,000
(-) කල්බදු වාරිකය		(2,059,229)
අවසන් කල්බදු වගකීම		4,780,771
ජංගම කොටස		
ඊළඟ වාරිකය	2,059,229	
(-)ඊළඟ වාරිකයේ පොලිය (4,780,771 X 14%)	(669,308)	1,389,921
ජංගම නොවන කොටස		
අවසන් වගකීම	4,780,771	
(-)ජංගම	(1,389,921)	3,390,850

වසර	ආරම්භක ශේෂය	වාරික	පොලී	ප්‍රාග්ධනය කොටස	අවසන් ශේෂය
1	6,000,000	2,059,229	840,000	1,219,229	4,780,771
2	4,780,771	2,059,229	669,308	1,389,921	3,390,850
3	3,390,850	2,059,229	474,719	1,584,510	1,806,341
4	1,806,341	2,059,229	252,887	1,806,341	-

(ලකුණු 06)

(මුළු ලකුණු 10)

හත්වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

පරිච්ඡේදය 02

(a)

අංකය	ගලපන/නොගලපන	පැහැදිලි කිරීම
(1)	ගලපයි	2025 මාර්තු 31 වන දිනට වංචාව සිදුවී ඇති බැවින්, වංචාව හෙළිදරව් වීමෙන් වාර්තාකරණ කාල සීමාව තුළ සිදුවීමක් පැවති බව සනාථ වේ. එබැවින්, වංචාව මත සිදුවන පාඩුව 2025 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වාර්තාවලට ගැලපිය යුතුය.
(2)	නොගලපයි	කොටසක මිල රඳා පවතින්නේ ඒ කාලයේ පැවති වෙළඳපල තත්ත්වයන් මත ය. 2025 අප්‍රේල් 10 වන දිනට කොටස් මිල පහත වැටීමට හේතුව එම දිනයේ ඇති වූ වෙළඳපල කඩාවැටීමයි. එය වාර්තාකරණ කාල සීමාවෙන් පසුව ඇති වූ තත්වයකි. එබැවින්, එය 2025 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වාර්තාවලට ගැලපිය නොහැක. කෙසේ වෙතත්, බලපෑම සැලකිය යුතු නම්, හෙළිදරව් කිරීමක් කළ යුතුය.
(3)	නොගලපයි	සාමාන්‍ය කොටස්වල අවසාන ලාභාංශය, මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දීමෙන් පසුව පැවැත්වෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී කොටස් හිමියන් විසින් අනුමත කරනු ලැබේ. එබැවින්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ලාභාංශයට ලාභාංශය හඳුනා ගැනීමට නීත්‍යානුකූලභාවයක් නොමැත. එය නොගලපන සිදුවීමකි. කෙසේ වෙතත්, කොටසකට ලාභාංශය, මුළු ලාභාංශය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමත දිනය හෙළිදරව් කරනු ලැබේ.

(ලකුණු 05)

(b)

(i) අවසාන විලම්බිත බදු වගකීම 2,100 (පෙ.වැ1)

(ලකුණු 03)

(ii)

මුලු ආදායම් බදු වියදම

	Rs. 000
වසර සඳහා ආදායම් බදු වියදම (පෙ.වැ **2**)	6,000
විලම්භිත බදු ආපසු හැරවීම	(1,400)
මුලු ආදායම් බදු වියදම	4,600

(ලකුණු 02)

පෙරවැඩ 01 – විලම්භිත බදු ගණනය කිරීම

විස්තරය	ඉඩම්	ගොඩනැගිල	මුළු අගය
ගිණුම්කරණ ධාරණ වටිනාකම	10,000	38,500	48,500
(-)බදු පදනම	(10,000)	(31,500)	(41,500)
[පිරිවැය - සමුච්චිත ප්‍රාග්ධන දීමනා]		[54,000-22,500]	
තාවකාලික වෙනස	-	7,000	7,000

SRI LANKA

බදු අය කළ හැකි හෝ අඩු කළ හැකි තාවකාලික වෙනස	N/A	බදු අයකලහැකි තාවකාලික වෙනස්කම	බදු අයකලහැකි තාවකාලික වෙනස්කම
		බදු අනුපාතය	30%
		අවසාන විලම්බිත බදු	2,100
		ආරම්භක විලම්බිත බදු වගකීම	3,500
		විලම්භීත බදු ආපසු හැරවීම	(1,400)

පෙරවැඩ 02– ආදායම් බදු වියදම **ගණනය කිරීම**

	Rs. 000
බදු අයකල හැකි ලාභය	20,000
බදු අනුපාතය	30%
වර්ෂය සඳහා ආදායම් බදු වියදම	6,000

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

අනිවාර්ය ප්‍රශ්න 3 කි.
(මුළු ලකුණු 50)

C කොටස

අටවන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

(a)

සීමා සහිත Zigma පොදු සමාගම
2025/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලාභාලාභ හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

	සටහන්	රු..000
විකුණුම්		354,000
විකුණුම් පිරිවැය		(151,200)
දළ ලාභය		202,800
අනෙකුත් ආදායම්	1	8,600
බෙදාහැරීමේ වියදම් (පෙ.වැ 01)		(35,750)
පරිපාලන වියදම් (පෙ.වැ 02)		(40,435)
මූල්‍ය වියදම් (පෙ.වැ 03)		(14,050)
අනෙකුත් මෙහෙයුම් වියදම් (පෙ.වැ 10)		(2,000)
බදු පෙර ලාභය	2	119,165
ආදායම් බදු (පෙ.වැ 09)	3	(9,750)
බදු පසු ලාභය		109,415
අනෙකුත් විස්තීර්ණ ආදායම්		2,000
මුළු විස්තීර්ණ ආදායම		111,415

(ලකුණු 10)

(b)

සීමා සහිත Zigma පොදු සමාගමේ
2025/03/31 දිනට
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	රු.. 000	රු.. 000
<u>ජංගම නොවන වත්කම්</u>			
දේපළ පිරියත හා උපකරණ	4	55,365	55,365
<u>ජංගම වත්කම්</u>			
තොගය		63,000	
වෙළඳ ලැබිය යුතු දෑ	5	35,550	
මුදල් සහ මුදල් සමාන දෑ		55,525	154,075
මුළු වත්කම්			209,440
<u>හිමිකම</u>			
ප්‍රකාශිත ප්‍රාග්ධන		50,000	
ප්‍රත්‍යාගණන සංචිතය		5,000	
රඳවාගත් ඉපැයුම්		117,815	172,815

ජංගම නොවන වගකීම්			
දිගුකාලීන ණය (පෙ.වැ 05)		4,500	4,500
ජංගම වගකීම්			
වෙළඳ ගෙවිය යුතු දෑ		20,725	
උපචිත ආදායම් බදු (-4,500)		7,750	
අනෙකුත් ගෙවිය යුතු දෑ	**6**	2,150	
ණය (ජංගම කොටස) (පෙ.වැ 05)		1,500	32,125
මුළු හිමිකම් හා වගකීම්			209,440

(ලකුණු 07)

(c)

සීමා සහිත Zigma පොදු සමාගමේ
2025/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ස්කන්ධයේ වෙනස්වීම් දැක්වෙන ප්‍රකාශනය

රු.. 000

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපැයුම්	එකතුව
ආරම්භක ශේෂය	50,000	3,000	8,400	61,400
මුළු විස්තීර්ණ ආදායම්		2,000	109,415	111,415
අවසන් දිනට ශේෂය	50,000	5,000	117,815	172,815

(ලකුණු 03)

(d) දේපල පිරියත හා උපකරණ:

පිරිවැය/ප්‍රත්‍යාගණනය	ඉඩම්	ගොඩනැගිලි	මෝටර් රථ	එකතුව
ආරම්භක ශේෂය	28,000	23,000	14,000	65,000
එකතු කිරීම් (පෙ.වැ 04)		15,000		15,000
ඉවත් කිරීම්			(6,000)	(6,000)
ප්‍රත්‍යාගණනය (පෙ.වැ 07)	2,000			2,000
අවසන් ශේෂය	*30,000*	*38,000*	*8,000*	*76,000*
සමුච්චිත ක්ෂය				
ආරම්භක ශේෂය		13,500	6,500	20,000
වාර්ශික ක්ෂය		535	1,600	2,135
ඉවත් කිරීම්			(1,500)	(1,500)
අවසන් ශේෂය	-	*14,035*	*6,600*	*20,635*
ධාරණ අගය	**30,000**	**23,965**	**1,400**	**55,365**

(ලකුණු 05)

සටහන් 01 අනෙකුත් ආදායම්

	රු.. 000
මෝටර් රථ ඉවත්කිරීම් ලාභය	500
අනෙකුත් ආදායම්	8,100
	8,600

සටහන් 02 පහත සඳහන් වියදම් බදු වලට පෙර ලාභයෙන් අඩු කරන ලදී.

	රු.. 000
ක්ෂය	2,135
බොල්ණය	1,500
වන්දි	2,000
විගණන ගාස්තු	150

සටහන් 03 ආදායම් බදු

	රු.. 000
ප්‍රවර්ථන වර්ෂයේ බදු වියදම	9,750
පෙර වසරේ අධි/ඌණ වෙන්කිරීම	-
මුලු ආදායම් බදු වියදම	9,750

සටහන් 04 වෙළඳ ලැබිය යුතු දෑ

	රු.. 000
වෙළඳ ලැබිය යුතු දෑ	41,000
(-)බොල්ණය	(1,500)
බොල් ණය වලින් පසු වෙළඳ ලැබිය යුතු ශේෂය	39,500
(-) වෙළෙඳ ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදනය	(3,950)
වෙළෙඳ ලැබිය යුතු ධාරණ අගය	35,550

සටහන් 05 අනෙක් ගෙවිය යුතු දෑ

	රු.. 000
ගෙවිය යුතු වන්දි	2,000
ගෙවිය යුතු විගණන ගාස්තු	150
	2,150

aat SRI LANKA

පෙරවැඩ

පෙරවැඩ 01

වියදම් විශ්ලේෂණය

විස්තරය	**විකුණුම් පිරිවැය**	**පරිපාලන**	**බෙදාහැරීම්**	**මූල්‍ය**	**වෙනත්**
ගොඩනැගිලි ක්ෂයවීම		535			
මෝටර් වාහන ක්ෂයවීම			1,600		
ණය ගැනීමේ පිරිවැය				(450)	
බොල්ණය			1,500		
ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදනය			3,950		
වන්දි					2,000
විගණන ගාස්තු		150			
ශේෂ පිරික්සුම	151,200	39,750	28,700	14,500	
	151,200	**40,435**	**35,750**	**14,050**	**2,000**

පෙරවැඩ 02

මෝටර් වාහන ඉවත් කිරීම

ඉවත් කිරීමේ ලාභ හා අලාභ

මෝටර් වාහන	6,000	මුදල්	5,000
වෙනත් ආදායම්	500	මෝටර් රථ සමුච්චිත ක්ෂය	1,500
	6,500		6,500

ඉවත කල මෝටර් රථ වාහනයක පිරිවැය

ඉවත් කිරීමේ ලාභ හා අලාභ හර 6,000
මෝටර් රථ *බැර* 6,000

ඉවත කල මෝටර් රථ සමුච්චිත ක්ෂයවීම්

මෝටර් රථ සමුච්චිත ක්ෂය හර 1,500
ඉවත් කිරීමේ ලාභ හා අලාභ 1,500

ඉවත් කිරීමේ ලාභ *(5,000 – 4,500)*

ඉවත් කිරීමේ ලාභ හා අලාභ හර 500
වෙනත් ආදායම් *බැර* 500

පෙරවැඩ 03

සුදුසුකම් ලත් වත්කමේ ණය ගැනීමේ පිරිවැය

	රු. **000**
ණය	6,000
පොලී අනුපාතය	10%
ඉදිකිරීම් කාලය (1/4/24 – 31/12/24)	9/12
ප්‍රාග්ධනිත කලයුතු ණයගැනුම් පිරිවැය	450

ප්‍රාග්ධන නොනිමි වැඩ හර 450
මූල්‍ය වියදම් *බැර* 450

පෙරවැඩ 04

ප්‍රාග්ධන නොනිමි වැඩ ගොඩනැගිලි ගිණුමට මාරු කිරීම

ප්‍රාග්ධන ගොඩනැගිලි නොනිමි වැඩ 2024/12/31 වන විට අවසන් කර ඇති බැවින්, එහි පිරිවැය ගොඩනැගිලි ගිණුමට මාරු කරනු ලැබේ.

	රු. **000**
ප්‍රාග්ධන නොනිමි වැඩ වල ධාරණ අගය	14,550
ප්‍රාග්ධනිත කල ණය ගැනුම් පිරිවැය	450
ගොඩනැගිලි ගිණුමට මාරු කල ප්‍රාග්ධන නොනිමි වැඩ	15,000

ගොඩනැගිලි හර 15,000
ප්‍රාග්ධන නොනිමි වැඩ *බැර* 15,000

aat SRI LANKA

පෙරවැඩ 05

ණය ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය

LKAS 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අනුව, වගකීම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කළ යුතුය.

	රු. **000**
ණය ශේෂය	6,000
ජංගම කොටස (25%)	1,500
ජංගම නොවන කොටස (75%)	4,500

පෙරවැඩ 06

ක්ෂය

වත්කම්	**ගොඩනැගිලි**	**මෝටර් රථ**
පිරිවැය	23,000	14,000
(-)ඉවත් කල මෝටර්රථයේ පිරිවැය		(6,000)
	23,000	8,000
ජීව කාලය	50	5
වර්ෂය පුරා පවත්වාගෙන ගිය වත්කම් ක්ෂය	460	1,600
මාරු කල ප්‍රාග්ධන නොනිමි වැඩ ක්ෂය 15,000/50X3/12	75	
මුළු ක්ෂය	535	1,600

පෙරවැඩ 07

ඉඩම් ප්‍රත්‍යාගණනය

ප්‍රත්‍යාගණන ලාභ / අලාභ	රු.**000**
ප්‍රත්‍යාගණන අගය	30,000
ධාරණ අගය	28,000
ප්‍රත්‍යාගණන ලාභ	2,000

ඉඩම් හර 2,000

ප්‍රත්‍යාගණන සංචිත *බැර* 2,000

පෙරවැඩ 08

වෙළඳ ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදනය

	රු.**000**
බොල් ණය අඩුකිරීමෙන් පසු වෙළඳ ලැබිය යුතු ශේෂය	39,500
ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදනය	10%
ලැබිය යුතු දෑ සඳහා අවසාන ප්‍රතිපාදනය	3,950
වෙළඳ ලැබිය යුතු දෑහි ධාරණ අගය සඳහා ප්‍රතිපාදනය	-
වෙළඳ ලැබිය යුතු දෑ සඳහා ඌණ ප්‍රතිපාදනය	3,950

ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදනය හර 3,950

ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම *බැර* 3,950

පෙරවැඩ 09

ප්‍රවර්ථන වසරේ බද්ධ

	රු **000**
ප්‍රවර්ථන වසරේ බදු වියදම	9,750
ප්‍රවර්ථන වසරේ බදු ගෙවීම (6,500 – 4,500)	(2,000)
ප්‍රවර්ථන වසර සදහා ගෙවිය යුතු බදු	7,750

බදු වියදම හර 9,750

ගෙවූ බදු *බැර* 2,000

ගෙවිය යුතු බදු *බැර* 7,750

පෙරවැඩ 10

ගෙවිය යුතු වන්දි

නීතිඥයින් තහවුරු කර ඇති පරිදි, සම්පූර්ණ වන්දියක් ගෙවීමට ඉහළ සම්භාවිතාවක් ඇති බැවින්, LKAS 37 ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් අනුව ප්‍රතිපාදනයක් අවශ්‍ය වේ.

වන්දි වියදම් හර 2,000

ගෙවිය යුතු වන්දි *බැර* 2,000

(මුළු ලකුණු 25)

නවවන ප්‍රශ්නය සදහා යෝජිත උත්තර :

සීමා සහිත Vikash සමූහය
2025/3/31 න් අවසන් වර්ෂය සදහා
ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

	(රු.'000)
විකුණුම් (1,035,200+624,000-75,000)	1,584,200
විකුණුම් පිරිවැය (703,900+443,000-75,000 +1,000)	(1,072,900)
විකුණුම් පිරිවැය	511,300
වෙනත් ආදායම්	
වෙනත් ආදායම් (3,600+900- 3,000 – 100)	1,400
වත්කම් ඉවත් කිරීම මත ලාභය (200+620-500)	320
බෙදාහැරීමේ වියදම් (640,0000+34,000)	(98,000)
පරිපාලන වියදම් (116,000+67,000 +3,000 +100)	(179,900)
මූල්‍ය වියදම් (18,500+23,400-100)	(41,800)
බදු පෙර ලාභය	193,320
ආදායම් බදු (40,980+16,564)	(57,544)
බදු පසු ලාභය	135,776
මව් සමාගමේ කොටස් හිමියන්ට බෙදාහැරීමට ඇති ලාභය (135,776 – 4,106)	131,670
පාලනයට යටත් නොවන කොටස් හිමියන්ට බෙදාහැරීමට ඇති ලාභය (W1)	4,106
අනෙක් විස්තීර්ණ ආදායම්	355
මුළු විස්තීර්ණ ආදායම්	136,131
මව් සමාගමේ කොටස් හිමියන්ට බෙදාහැරීමට ඇති මුළු විස්තීර්ණ ආදායම (136,131 – 4,106)	132,025

පාලනයට යටත් නොවන කොටස් හිමියන්ට බෙදාහැරීමට ඇති මුළු විස්තීර්ණ ආදායම (W1)	4,106

W- 1 පාලනයට යටත් නොවන කොටස් හිමියන්ට බෙදාහැරීමට ඇති ලාභය

	ලාභය
පොත් අගය මත පාලනයට යටත් නොවන කොටස් හිමියන්ට හිමි ලාභය (41,556 X 10%)	4,156
+/- ගැලපීම්	
යන්ත්‍ර මත උපලබ්ධි නොවූ ලාභය 500 X 10%	(50)
පාලනයට යටත් නොවන කොටස් හිමියන්ට බෙදාහැරීමට ඇති ලාභය	4,106

W-2 අන්තර් සමාගම් විකුණුම්

	රු. 000
අයිතම පිරිවැය	60,000
පිරිවැය මත ලාභය 25%	15,000
විකුණුම් වටිනාකම	75,000

අයභාරය හර 75,000
විකුණුම් පිරිවැය *බැර* 75,000

W-3 තොග විකුණුම් මත උපලබ්දි නොවූ ලාභය

	රු. 000
තොගය	5,000
පිරිවැය මත ලාභය	25%
උපලබ්දි නොවූ ලාභය (5,000/125X25)	1,000

විකුණුම් පිරිවැය හර 1,000
තොගය *බැර* 1,000

W- 4 අන්තර් සමාගම් කළමනාකරණ ගාස්තු

වෙනත් ආදායම් හර 3,000
පරිපාලන වියදම් *බැර* 3,000

W-5 අන්තර් සමාගම් පොලී

	රු. 000
ණය	2,000
පොලී අනුපාතය	10%
කාලය	6/12
අන්තර් සමාගම් පොලී	100

පොලී ආදායම් හර 100
පොලී වියදම් *බැර* 100

aat SRI LANKA

W-6 යන්ත්‍ර ඉවත් කිරීම මත උපලබ්දි නොවූ ලාභ (විකුණුම්කරු පරිපාලිතය)

	රු. 000
යන්ත්‍ර ඉවත් කල වටිනාකම	10,000
ධාරණ අගය	9,500
උපලබ්දි නොවූ ලාභ	500

යන්ත්‍ර ඉවත් කිරීමේ ලාභය හර 500 (ලාභයේ NCI කොටසට ගැලපීම)
යන්ත්‍ර *බැර* 500

W- 7 යන්ත්‍රෝපකරණ මත උපලබ්ධි නොවූ ලාභ මත ක්ෂය වීම

	රු. 000
උපලබ්දි නොවූ ලාභ	500
ප්‍රයෝජනවත් ජීවකාලය	5
භාවිතා කල කාලය	1
උපලබ්දි නොවූ ලාභ මත ක්ෂය	100

යන්ත්‍රෝපකරණ සමුච්චිත ක්ෂය හර 100
පරිපාලන වියදම් *බැර* 100

(මුළු ලකුණු 10)

10 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර :

(a)

අනුපාතය	**සූත්‍රය**	**වර්ෂය 31/3/2025**	**වර්ෂය 31/3/2024**
දළ ලාභ අනුපාතය	දළ ලාභය/විකුණුම් X 100	=146,000/410,000X100 =35.6%	=107,500/320,000X100 =33.6%
ශුද්ධ ලාභ අනුපාතය	බදු පසු ලාභය/විකුණුම් X 100	=42,884/410,000X100 =10.5%	=20,093/320,000X100 =6.3%
ණයගැති එකතු කිරීමේ කාලය	365/ණයට විකුණුම් X සාමාන්‍ය ණයගැති	=365/410,000X (54,000+42,000)/2 =43 දින	=365/320,000X (42,000+32,000)/2 =42 දින
තොග රැඳවුම් කාලය	365/ විකුණුම් පිරිවැය X සාමාන්‍ය තොගය	=365/264,000X (82,000+75,000)/2 =109 දින	=365/212,500X (75,000+20,000)/2 =82 දින
කොටසක ඉපැයුම	සාමාන්‍ය කොටස් හිමියා වෙත බෙදාහැරීමට ඇති ලාභය / සාමාන්‍ය කොටස් ගණන	=42,884/20,000 = රු.2.1	=20,093/20,000 = රු.1

(ලකුණු 10)

(b)

වෙතට : රෙක්ස් පීඑල්සී කළමනාකරණය

මගින් : මූල්‍ය උපදේශක

අන්තර්ගතය : 2025 මාර්තු 31 සහ 2024 න් අවසන් වන වසර සංසන්දනය කරමින් Rex· PLC පිළිබඳ සාරාංශ වාර්තාව

දිනය : 25/7/2025

ලාභදායිත්වය

වසර තුළ දළ ලාභ ආන්තිකය 33.6% සිට 35.6% දක්වා ඉහළ ගොස් ඇත. ඉහත වැඩිවීමට ප්‍රධාන හේතු වී ඇත්තේ වසර තුළ විකුණුම් රුපියල් මිලියන 90 කින් වැඩිවීමයි. විකුණුම් පිරිවැය වැඩිවීම රුපියල් මිලියන 51.5 ක් පමණි. එබැවින්, සමාගම වඩා හොඳ අලෙවිකරණය, මිලකරණ තීරණ සහ පිරිවැය කළමනාකරණය පෙන්නුම් කරයි.

ශුද්ධ ලාභ ආන්තිකය 6.3% සිට 10.5% දක්වා වැඩි වී ඇත. ශුද්ධ ඉතිරිකිරීම් වැඩි වී ඇති බැවින් මෙම වැඩිවීම සමාගමට වාසිදායක වේ. දළ ලාභයෙන් ලැබෙන ප්‍රතිලාභ මෙන්ම ව්‍යාපාරයේ පරිපාලනය, බෙදා හැරීම, මූල්‍ය සහ බදු වියදම් වඩා හොඳින් කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම ද හේතු විය හැකිය.

සමස්තයක් වශයෙන් ව්‍යාපාරයේ ලාභදායීතාවය පෙර වසරට වඩා සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. මෙම ලාභදායිතා වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස කොටසක ඉපැයීම් පෙර වසරේ රු. 1/- සිට වත්මන් වසරේ රු. 2.1 දක්වා වැඩි වී ඇත. එබැවින්, ආයෝජකයින්ගේ ලාභය වසර තුළ දෙගුණයකට වඩා වැඩි වී ඇත.

කාර්යක්ෂමතාව සහ කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ණය එකතු කිරීමේ කාලය පසුගිය වසරේ දින 42 සිට වත්මන් වසරේ දින 43 දක්වා දින 01 ක පමණ සුළු වැඩිවීමක් පෙන්නුම් කරයි. වෙනස නොසැලකිය හැකිය. කෙසේ වෙතත්, ණය එකතු කිරීම පෙර වසරට වඩා සුළු වශයෙන් අඩු වී ඇති බව පෙනේ. මෙය වසර තුළ නව ගනුදෙනුකරුවන් හරහා ජනනය කරන ලද නව විකුණුම් නිසා විය හැකිය.

වසර තුළ තොග රඳවා ගැනීමේ කාලය දින 82 සිට දින 109 දක්වා වැඩි වී ඇත. මෙම දින 27 ක වැඩිවීම තොග කළමනාකරණයේ කාර්යක්ෂමතාවයේ පහත වැටීමක් පෙන්නුම් කරයි. පෙර වසරට සාපේක්ෂව තොග ගබඩාවේ දින 27 ක් වැඩිපුර තබා ඇති අතර එමගින් තොග රඳවා ගැනීමේ පිරිවැය වැඩි වන අතර තොග හානිකරනයේ අවදානමක් ඇත. මෙය වසර තුළ වැඩි වූ විකුණුම් කළමනාකරණය කිරීම සඳහා අමතර තොග තබා ගැනීම නිසා හෝ නිසි තොග කළමනාකරණයක් නොමැතිකම නිසා විය හැකිය.

සමස්තයක් වශයෙන් ණයගැතියන් සහ තොග කළමනාකරණයෙහි කාර්යක්ෂමතාව සහ කාරක ප්‍රාග්ධන කළමනාකරණය වසර තුළ දුර්වල වී ඇත. (ලකුණු 05)

(මුළු ලකුණු 15)

C කොටසෙහි අවසානය

Notice:

These answers compiled and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the “Only” answers, or, for that matter even as “Model Answers”. The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

AAT SRI LANKA

© 2021 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka). All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)